කෙසෙල්වත්ත පොලිස් වසමේ පදිංචිව සිටි, නිවෙස් වලින් අතුරුදන් වී නැවත නිවෙස් වෙත පැමිණි බවට කියැවෙන, වයස අවුරුදු දාහතරත් පහළොවත් අතර යැයි පැවසෙන බාලවයස් දැරියන් තිදෙනා සම්බන්ධයෙන් සති අග අරුණ (11/14) පුවත්පතේ, "කොරියාවේ බ්ලැක් පින්ක්ලා ලංකාවේ ෆාතිමාට බොහෝ දුරයි" යන සිරස්තලය ඔස්සේ ලිපියක් පළ වී තිබිණි.

ඉහත කී සිදුවීම පසුතල කරගනිමින්, ඒ ඔස්සේ කතිකාවට ලක් විය යුතු සමාජ පැතිකඩක් එම ලිපිය ඔස්සේ සාකච්ඡාවට බඳුන් කර තිබිණි.

කෙසේ නමුත්, ලිපිය සමගින් එම බාලවයස්කාර දැරියන් තිදෙනාගේ අනන්‍යතාවය නිරාවරණය වන අයුරින්, ඔවුන්ගේ ඡායාරූපයක් ද පළවී තිබිණි.

බාලවයස්කරුවන් හට තම පාසල් අධ්‍යාපනය අනවශ්‍ය බාධාවන්ගෙන් තොරව සම්පූර්ණ කර ගැනීමට නිදහස තිබිය යුතු හෙයින්, බාලවයස්කරුවන්ගේ අනන්‍යතාවයන් මාධ්‍ය මගින් හෙළිදරව් නොකළ යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාරධර්ම නිර්දේශයන් තුළ සඳහන් කෙරේ.

එසේ නම්,

1) මෙම ලිපිය තුළ සමාජ වෙනසක් පිළිබඳව සාකච්ඡාවට ලක් වුවත්, ඒ සඳහා මෙම බාලවයස්කාර දැරියන්ගේ ඡායාරූප, ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිකරමින් පළ නොවූයේ නම් වඩාත් යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද?

ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.unicef.org/eca/media/ethical-guidelines
https://www.ipso.co.uk/media/1603/children-pub-info-v3.pdf
https://rm.coe.int/jufrex-media-regulatory.../168093e0d8
https://slpi.lk/.../code-of-professional-practice-code.../